# ඉදිරියට

දින 21 ක් නිරාහාරව සිටීම සහ යාච්ඤාව

# ඉදිරියට

## හැඳින්වීම

දෙවියන්වහන්සේ ප්‍රතිචාර දක්වනවා උන්වහන්සේ සොයන්නාට. අපි 2021 වසර ආරම්භයත් සමගම දවස් 21ක් නිරාහාරව සහ යාච්ඤාවෙන් දෙවියන්වහන්සේ ඉදිරියට ඒමට සූදානම් වෙමු. එහිදී උන්වහන්සේ අපගේ බලාපොරොත්තු අලුත් කරනවා, උන්වහන්සේගේ සැලැස්ම සහ පරමාර්ථය ආරම්භ කරමින් අලුත් දැක්මක් තුල අපව ඉදිරියට ගෙන යනවා.

මෙම දින 21 තුල අපගේ තේමාව වන්නේ "ඉදිරියට" යන්නය. අපගේ වාතාවරණය මත දෙවියන්වහන්සේගේ පරමාර්ථය වෙනස් වන්නේ නැ. ඒ වෙනුවට උන්වහන්සේගේ සැලැස්මට අපිව ඉදිරියට ගෙන යෑමට උන්වහන්සේ අපිව බලවත් කරනවා. අපගේ ජීවිතයේ අලුත් තලයකට අපට යන්න උන්වහන්සේ උදව් කරනවා.

සෑම සතියකම මෙම මෙනෙහි කිරීමේ කාලයට විශේෂිත එල්ලයක් ඇත - ශක්තිමත්ව සිටගැනීම, ආත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම සහ භූමිය අත් පත් කරගැනීම. සෑම දවසකම ඔබට මෙනෙහි කිරීමට කොටසක් ලැබෙන අතර යාච්ඤා මගපෙන්වීමක් ඇත. ඔබට දේව වචනයේ කොටසක් කියවීමට ලැබෙන අතර මෙම දවස් 21 අවසන් වන විට ක්‍රියා පොතම කියවා අවසන් කිරීමට අප බලාපොරොත්තු වෙමු. ඔබගේ පුද්ගලික මෙනෙහි කිරීමේ කාලය තුල දෙවියන්වහන්සේට ඉඩ දෙන්න ඔබ සමග කතා කිරීමට. දෙවියන්වහන්සේගේ වචනය මෙනෙහි කිරීමට කාලය ගන්න ඒ වගේම ඒ කොටස ගැන දෙවියන්වහන්සේ ප්‍රතිචාර දැක්වීම ගැන යාච්ඤා කරන්න. ඔබට මෙම වසරේ සූදානම් කරලා තියෙන දේ ගැන මගපෙන්වීමක් දෙවියන්වහන්සේට ඉඩ දෙන්න. ඔබගේ හදවත වෙනස් කිරීමට දෙවියන්වහන්සේට ඉඩ දෙන්න.

## නිරාහාර යාච්ඤාව යනු කුමක්ද?

නිරාහාර යාච්ඤාව යනු යම් කාලපරිච්ඡේදයක් තුළ අප ආහාර ගැනීමෙන් උවමනාවෙන්ම වැළකී සිටීමේ ආත්මික විනය කි. අප අපගේ ස්වභාවික ආශාවන් ප්‍රතික්ෂේප කොට අප අපවම යටහත් පහත් වමේන් දෙවියන් වහන්සේ කෙරෙහි අපගේ එල්ලේ යොමු කිරීමට කාලය ගැනීමකි.

නිරාහාර යාච්ඤාව කැප කරන ලද යාච්ඤා කාලයක් සමග විය යුත්තකය. එමෙන්ම දෙව වචනය අධ්‍යයනය තුළින් එකට බැඳීමකි. ඔබ මෙම ආරම්භ කළ යුත්තේ කොතනින්ද යනවග පිළිබඳව ඔබට අදහසක් නොමැති නම්, සෑම දිනකටම ඇති ආත්මික මග පෙන්වීම තුළ ඔබට අනුගමනය කළ හැකි දේව වචනය කොටසක් සහ සරල යාච්ඤාවක් ද අන්තර්ගත වේ.

නිරාහාර යාච්ඤාව දෙවියන් වහන්සේගේ මනස උන් වහන්සේගේ කැමැත්ත නැතහොත් උන් වහන්සේගේ අවසරය ලබා ගැනීමට දරන උත්සාහයක් නොව වන අතර එය අපගේ ආකල්පය සහ දර්ශනය වෙනස් කර ගැනීමකි. එමෙන්ම එය තුලින් අප සම්පූර්ණ ලෙස දෙවියන් වහන්සේ මත රඳා පැවතීමට මතක් කර දෙයි. නිරාහාර යාච්ඤාව දෙවියන් වහන්සේගේ ක්‍රියාවට පෙරෙ සිදුවන්නක් ද වේ.බයිබලය උදාහරණ කිහිපයක් විස්තර කරයි.

මෝසෙස් ආත්මික ඉදිරි පියවරක් සොයමින් උන් විට ඔහු දසපනත ලැබෙන තුරු දින හතළිහක් කෑමෙන් බීමෙන් වැළකී සිටියහ. ( නික්මයාම 24:18 )

දාවිත් පුද්ගලික ආත්මික ඉදිරි පියවරක් උදෙසා තමාව යටත් පහත් කර ගනිමින් නිරාහාර යාච්ඤාවේ යෙදුණි. (ගීතාවලිය 35:13)

පිටුවහල් කරන ලද සෙනෙඟ දෙවියන් වහන්සේට විරුද්ධ ව කැරලි ගසමින් සිටින විට ඔවුන් තුළ ආත්මික මහත් ඉදිරි පියවරක් හෝ මහත් වෙනසක් ඇතිවීමට නිරාහාරව යාච්ඤා කළේය. (දානියලේ 9:3-4)

යේසුස් වහන්සේ උන්වහන්සේගේ ප්‍රසිද්ධ සේවය ඇරඹීමට ප්‍රථම දින 40ක නිරාහාරය යාච්ඤාවේ යෙදුනි. (මතවේ 4:1-2)

# ආරම්භ කිරීම

ඔබ මෙම ආත්මික මගපෙන්වීම ආරම්භ කිරීමට ප්‍රථම ඔබ නිරාහාරව
යාච්ඤා කරන්නේ කුමක් උදෙසා ද යන්න තීරණය කරන්න. ඔබ කුමක් කිරීම
උදෙසා දෙවියන් වහන්සේ විශ්වාස කරන්නේද යන්න පිළිබඳ සූදානම් වන්න.
ඔබ කොපමණ සූදානම් වී මෙම දින 21 ඇතුළු වන්නේ ද එපමණ දෙවියන්
වහන්සේ ක්‍රියා කරන බව ඔබට බලාපොරොත්තු විය හැකිය.

## ඔබ නිරාහාරයෙන් සිටින්නේ කුමකින් ද යන්න තීරණය කරන්න.

සම්පූර්ණ නිරාහාරය : සියලු ඝන ආහාරවලින් වැළකීම.
අර්ධ නිරාහාරය : දිනක ආහාර වේල් එකකින් හෝ දෙකකින් වැළකී සිටීම
හෝ එක්තරා වර්ගයක ආහාර හෝ පාන වලින් වැලකීම.
අනෙකුත් කරුණු : අනෙකුත් ක්‍රියාකාරකම් වලින් වැළකී සිටීම. (උදාහරණ:
විනෝදාස්වාදයන්, විනෝදාංග, සමාජ මාධ්‍ය)

## ඉලක්ක කිහිපයක් තබා ගන්න

ඉදිරි දින විසි එකෙහි (21) කාල පරිච්ඡේදය තුළ ඔබගේ ජීවිතයේ දෙවියන්
වහන්සේ කතා කළ යුතු පැතිකඩ සහ සුවිශේෂී ඉලක්කයන් කිහිපයක්
ලියා තබා ගන්න. දෙවියන් වහන්සේ ඉතා සමීප ලෙස දැන ගැනීමට මෙන්ම
උන්වහන්සේගේ හඬ ඉතා පැහැදිලිව ඇසීමට පටන් ගන්න. ඔබගේ ජීවිතයේ
ආත්මික බලවත් වෙනසක් හෝ ඉදිරි පියවරක් ඇතිවිය යුතු පැතිකඩ ඇත්නම්
ඒවා දෙවියන් වහන්සේට භාර දෙන්න. ඔබ නිරාහාරව යාච්ඤා කරන
විට උන්වහන්සේ ඔබේ ජීවිතය තුළ ක්‍රියා කරන බව විශ්වාස කරන්න.
දෙවියන් වහන්සේ කතා කරන දෙයට විවෘත වී උන්වහන්සේ සොයන විට
උන්වහන්සේ කතා කරන දෙයට කීකරු වන්න.

## තව කෙනෙක් ඔබගේ ගමන හා හවුල් කරගන්න

අප සභාවක් ලෙස මීළඟ දින 21 තුළට ඇතුල්වන විටදී අප මෙය එක්ව
සිදු කරමු. මේ ගමන හා හවුල් කරගත හැකි යම් අයෙක් සොයා ගන්න.
ඔබගේ සහකරුවා හෝ සහකාරිය සමීප මිතුරෙක් නැතහොත් ඔබ සම්බන්ධ
කණ්ඩායමක යම් අයෙක් විය හැක. ඔබ එක්ව මෙම ආත්මික මගපෙන්වීම
සිදුකරන්න. ඔබ එකිනෙකා අතර පසුගිය සති තුනක කාලය තුළ දෙවියන්
වහන්සේ ඔබට කතා කළ දේ උන් වහන්සේ කළ දේ බෙදා ගැනීමට කැප
වෙන්න.

පළමු සතිය

# පළමු සතිය

මෙම පළවෙනි සතිය තුළ අප අපගේ හදවත් සහ මනස “ශක්තිමත් ව සිට ගැනීම” කෙරෙහි ස්ථිර කරගනිමු. දුෂ්කර සහ අභියෝග කාරණා අප කෙරෙහි පැමිණිය ද දෙවියන් වහන්සේ අපට ශක්තිමත්ව සහ ධෛර්යමත්ව සිට ගැනීමට බලය දී ඇති බව සිහි ගන්වමින් මෙම දින 21 ආරම්භ කරමු.

# දෙවියන් වහන්සේගේ පොරොන්දු සිහිකිරීම

මා මෝසෙස්ට දැන්වූ පරිදි නුඹලා පා තබන සෑම ස්ථානයක් ම මම නුඹලාට දෙමි. පාළුකරය හා මේ ලෙබනොන් දේශය පටන් මහා ගංගාව වන යුප්‍රටීස් ගංගාව දක්වා ඇති, හිත්තිවරුන්ගේ මුළු රට ද අපරදිග මහ මුහුද දක්වා ද නුඹලාගේ දේශ සීමා වනු ඇත. දිවි ඇති තාක් නුඹලාට විරුද්ධ ව කිසිවෙකුට නැඟී සිටින්නට නොහැකි වන්නේ ය. මම මෝසෙස් සමඟ සිටියාක් මෙන් නුඹ සමඟත් සිටින්නෙමි. මම නුඹ කෙරෙන් අහක් ව යන්නේ වත්, නුඹ අත්හරින්නේ වත් නැත.

**යෝෂුවා 1:3-5**

## සිතුවිල්ල

අපගේ බාහිර සිදුවීම් සහ තත්ත්වයන් වෙනස්ව වුව ද දෙවියන් වහන්සේගේ පොරොන්දු වෙනස් නොවේ. උන්වහන්සේ විශ්වාසවන්තව සිටිති. අපි දෙවියන් වහන්සේගේ පොරොන්දු මත යැපෙන විට අපට ශක්තිමත්ව සිට ගන්න පුළුවන්. දෙවියන් වහන්සේගේ පොරොන්දු ස්ථිර වන තුරු දෙවියන් වහන්සේ අප සමග බව මතක තබාගන්න.

## යාච්ඤාව

- දෙවියන් වහන්සේගේ පොරොන්දු සිහි කරන්න.
- උන්වහන්සේගේ විශ්වාසවන්ත කම ප්‍රකාශ කරන්න.
- අසීරු අවස්ථාවලදී ශක්තිමත් ව සිටීමට දෙවියන් වහන්සේගේ උපකාරය වෙනුවෙන් අයදින්න.

## අද දින බයිබල් කියවීම - ක්‍රියා 1 සහ 2 පරිච්ඡේද

# පරීක්ෂාව ප්‍රතික්ෂේප කිරීම

පොදුවේ හැම මිනිසකුට ම මූණ පාන්නට ඇති පරීක්ෂා හැර අනෙකක් ඔබ වෙත පැමිණ නැත. ඔබට දරාගත නොහැකි පරීක්ෂා ඔබ පිට පැමිණීමට ඉඩ නොහැර, ඔබට පරීක්ෂා දැරිය හැකි වන සේ ඒ සමඟ ම ගැළවීමේ මඟක් ඔබට සලසා දෙන දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබිය හැකි ය.

**1 කොරින්ති 10:13**

## සිතුවිල්ල

අප යම් අලුත් දෙයක් උදෙසා පා තැබීමට යම් සීමාවක සිටින විට සතුරා අපගේ පරණ පුරුදු සහ පරණ සිතුවිලි රටාවන්ගෙන් අපට විරුද්ධව ක්‍රියා කරයි. අපි දෙවියන් වහන්සේ ඉදිරියේ යටත් විය යුතුය. අපගේ පරීක්ෂාවන් දෙවියන් වහන්සේගේ ආලෝකයට ගෙන යා යුතු ය. දෙවියන් වහන්සේ විශ්වාසවන්තය. එමෙන්ම එම පරීක්ෂාවන් ගෙන් ජය ගැනීමට උපකාරී කිරීමේ හැකියාව දෙවියන් වහන්සේට ඇත.

## යාච්ඤාව

- අප දෙවියන් වහන්සේ ඉදිරියේ යටහත් වෙමු.
- උන්වහන්සේ කෙරෙහි ඔබගේ විශ්වාසය ප්‍රකාශ කරන්න.
- අපි පරීක්ෂාවට මුහුණ දෙන විට එයට මුහුණ දීම සඳහා දෙවියන් වහන්සේගේ බලය සහ ශක්තිය ඉල්ලන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 3 වන පරිච්ඡේදය**

# ස්ථිරව සිටගැනීම

දරුවනේ, ඔබේ දෙමව්පියන්ට සමිඳාණන් වහන්සේ තුළ කීකරු වන්න. එය ඔබගේ යුතුකම ය.

**එපීස 6:1**

## සිතුවිල්ල

බයිබලය අපට උගන්වන්නේ අප සියල්ල අධිපතිකම් වලටත් පරාක්‍රම ධාරීන් සහ අන්ධකාර ලෝක මුලාදෑනීන් ට විරුද්ධව ආත්මික සටනක සිටින බවයි. මෙම සටන මධ්‍යයේ සිටින අපට ජයග්‍රහණය කරා යාමට අවශ්‍ය සියලු දේ උන් වහන්සේ අපට ලබා දී ඇත. උන්වහන්සේ දී ඇති යුද කට්ටලය පැළඳ ගනිමින් ඔබගේ කොටස අත්පත් කරගන්න.

## යාච්ඤාව

- සතුරාගේ ප්‍රහාර වලට විරුද්ධව ස්ථිරව සිට ගැනීමට අපව සන්නද්ධ කර ඇති නිසා දෙවියන් වහන්සේට ස්තුතිවන්ත වෙමු.
- අපගේ ජීවිතයේ දුර්වල පැතිකඩ පෙන්වා දෙන ලෙස උන් වහන්සේගෙන් ඉල්ලීම් කරන්න.
- ඔබ උන් වහන්සේ මත යැපෙන බව නොසඟවා ප්‍රකාශ කරන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 4 වන පරිච්ඡේදය**

# දෙවියන් වහන්සේට කැප වී සිටීම

ඔබ මෙ දක්වා කර ඇති පරිදි ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට ම විශ්වාසවන්ත ව සිටින්න. මන්ද, සමිඳාණන් වහන්සේ ඉතා විශාල වූ විජාතීන් ඔබ ඉදිරියෙන් පන්නාදැමූ සේක. ඒ නිසා ඔබට විරුද්ධ ව සිටින්නට අද දවස දක්වා කිසිවකුට පුළුවන් වුණේ නැත. ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට පොරොන්දු වූ පරිදි ඔබ උදෙසා යුද්ධ කරන්නේ උන් වහන්සේ ය; එබැවින් ඔබෙන් එක් කෙනෙක් දහසක්දෙනා පන්නා දමන්නේ ය. එහෙයින් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට ප්‍රේම කරන්නට තරයේ ම අධිෂ්ඨාන කරගන්න.

**ජෝෂු 23:8-11**

## සිතුවිල්ල

අප ජයග්‍රහණය ලබන්නේ අපගේ ශක්තියෙන් හෝ අපගේ උත්සාහයෙන් නොව සෑම ජයග්‍රහණයක්ම පැමිණෙන්නේ දෙවියන් වහන්සේගෙන්ය. උන්වහන්සේ කෙරෙහි කැපවීම මහත් වූ ආත්මික ඉදිරි පියවරක් උදෙසා අපව ස්ථානගත කරයි. අපේ මෙනෙහි කිරීමේ කාලය සෝදිසියට ලක් වීමට පුළුවන. නමුත් අප එය අල්ලාගෙන ඉන්ට අවශ්‍ය ය. දෙවියන් වහන්සේ අප ජීවිතවල කේන්ද්‍රගත වී ඇති විට උන්වහන්සේ කෙරෙහි ම අප කැප වී සිටින විට අප නොකඩවා ජයග්‍රහණය අත් දකිනු ලබයි. ජීවිතයේ සෑම පැතිකඩයන් තුළ දෙවියන් වහන්සේව සොයන්න.ඒ සෑම පැතිකඩයකම ඒකාකාරී මලානික වූ සෑම දෙයක් තුළට දෙවියන්වහන්සේව ගෙන එන්න. (උදාහරණයක් ලෙස ඔබගේදිනපතා ජීවන රටාව තුළට )

## යාච්ඤාව

- දෙවියන් වහන්සේ ඔබගේ ජීවිතයේ කේන්ද්‍රගත කර ගැනීමට තීරණයක් ගන්න.
- ඔබගේ ජීවිතය සෑම පැතිකඩක්ම වහන්සේට ආරාධනා කරන්න.
- උන්වහන්සේ මත අප රැඳෙන බව යැපෙන බව නොසඟවා පවසන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 5 පරිච්ඡේදය**

# අප ශුද්ධ ව සිටීම

ජෝෂුවා සෙනඟට කතා කොට, “සමිඳාණන් වහන්සේ හෙට ඔබ අතරේ පුදුම දේ කරන්නට යන බැවින් පවිත්‍ර වන්නැ”යි කී ය.

**ජෝෂු 3:5**

## සිතුවිල්ල

අප ප්‍රවේශම් නොවුණහොත් පාපය සහ ශුද්ධකම අප ජීවිතයේ මුල් බැස ගැනීමට ඉඩ ඇත.අප තුළ මෙම සැඟවුණු දේ එළිදරව් කරන ලෙස අපි දෙවියන් වහන්සේගෙන් ඉල්ලීම් කළ යුතුය.ඒ සඳහා අපි තීරණයක් ගත යුතුය. අප මේ සැඟවුණු දේ සැඟවුණු පාපය අත්හැර දැමිය යුතු අතර අප දෙවියන් වහන්සේ උදෙසා වෙන් ව සිටිය යුතුය.
ඒ තුළින් උන්වහන්සේ උන්වහන්සේගේ සැලසුම් සහ අරමුණු අප තුළින් හා අප කෙරෙහි ඉෂ්ට කරනු ලබති.තෝරාගත්ත ශුද්ධකම පසුපස ලුහුබදින සහ දේවරාජ්‍යය තීරණ තෝරාගන්න. දෙවියන් වහන්සේට ඔබගේ ජීවිතයේ ක්‍රියා කළ යුතු පැතිකඩ එළිදරව් කිරීමට උන්වහන්සේ වෙනුවෙන් යම් කාලයක් අද දින වෙන්කර ගන්න.

## යාච්ඤාව

- ජීවිතයේ සැඟවුණු පාපය සහ ශුද්ධකම එළිදරව් කරන ලෙස උන් වහන්සේගෙන් අයදින්න.
- ඒ දේවල් අත්හැර දමා දෙවියන් වහන්සේට ඒවා යටත් කරන්න.
- දෙවියන් වහන්සේගේ අරමුණ වෙනුවෙන් වෙන් වූ සිටීමට තීරණයක් ගන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 6 සහ 7 පරිච්ඡේද**

# දේව වචනය මත සිට ගැනීම

‘‘“එහෙයින් යමෙක් මාගේ වචන අසා, ඒවා පිළිපදී ද, ඔහු පර්වතය මත තමාගේ ගෙය තනාගත් නැණවතෙකුට සමාන ය. වැසි වැස, ජලය ගලා, සුළඟ හමා ඒ ගෙට ගැසී ය, එය පර්වතය මත පිහිටි බැවින් බිඳ නොවැටිණි. ‘

**මතෙව් 7:24-25**

## සිතුවිල්ල

දේව වචනය අපගේ ජීවිතවල ස්ථිර අඩිතාලම වේ.දේව වචනය තුළ අපගේ ජීවිතය නැංගුරම් ලෑම තුළින් ශ්‍රද්ධාව වර්ධනය වී ජීවිතයේ අප වෙත එන සෑතුන් පසුකර ඉදිරියට යාත්‍රා කිරීමට අප සන්නද්ධ වනු ඇත. දෙවියන් වහන්සේගේ වචනය පමණක් නොව අපට අවශ්‍යයි ඒ කියන වචනය තුළ ක්‍රියා කරන්න. දේව වචනයේ දවස ආරම්භ කිරීම පුරුද්දක් කර ගන්න. ඔබ කතා කරන එක් බයිබල් පදයක් තෝරාගන්න. සෑම දිනක්ම කාලය ගතවෙතේම දෙවියන් වහන්සේට උන්වහන්සේගේ වචනයෙන් කතා කිරීමට ඉඩ දෙන්න.

## යාච්ඤාව

- අප මඟ පෙන්වන අපව යොමු කරන දෙවියන් වහන්සේගේ වචනයට ස්තුතිවන්ත වන්න.
- උන්වහන්සේගේ වචනය අපගේ ජීවිතවලට අදාළ කරගන්නේ කෙසේද යන්න උන්වහන්සේගෙන් අසන්න.
- දේව වචනය හා දැනගැනීම සඳහා නැවුම් ආශාවක් වෙනුවෙන් යාච්ඤා කරන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 8 පරිච්ඡේදය**

# අරමුණ තුළ ශක්තිමත්ව සිටීම

'එහෙත් පේදුරු ද ජොහන් ද පිළිතුරු දෙමින්, "දෙවියන් වහන්සේට කීකරු වීමට වඩා ඔබට කීකරු වීම හරි දැ යි, දෙවියන් වහන්සේ ඉදිරියේ ඔබ ම විනිශ්චය කරගන්න. මන්ද, අප ඇසූ දුටු දේ ගැන කතා නොකර සිටින්නට අපට නොහැකි ම ය"යි කී හ. '

**ක්‍රියා 4:19-20**

## සිතුවිල්ල

දෙවියන් වහන්සේ අපව සුවිශේෂ අරමුණක් සඳහා සුවිශේෂී කාලයක් තුළ කැඳවා ඇත. දෙවියන් වහන්සේගේ කැඳවීම පුදුමයට පත්කරන දෙයක් සහ පළෙඹීමට පත්කරන දෙයෙක්. නමුත් අපගේ පරමාර්ථය සෝදිසියට ලක් වෙනවා. දෙවියන් වහන්සේ අප කැඳවන තිබෙනෙ දේ අපි තදින් අල්ලා ගත යුතු සේ ම විශ්වාස කරන්න සියලු දේ යහපත ට හැරෙනෙ බව. දෙවියන් වහන්සේ තුළ මමෙ කාලයේ ඔබ කැඳ වූ දෙයට විශ්වාසවන්තව සිටීමට තීරණයක් ගන්න. ඔබගේ ජීවිතය රඳවා තබා ගත හැකි හොඳම ස්ථානය දෙවියන් වහන්සේගේ සැලැස්ම සහ උන්වහන්සේගේ කැමැත්ත තුළ බව මතක තබා ගන්න.

## යාච්ඤාව

- අපගේ ජීවිතය තුළ දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තකම ගැන ස්තුති කරන්න.
- දෙවියන් වහන්සේ අපගේ ජීවිතය කෙරෙහි ඇති සැලසුම් සහ අරමුණු යහපත් බව විශ්වාස කරන්න.
- අපගේ කැඳවීමට විශ්වාසවන්ත වීමට දෙවියන් වහන්සේගෙන් උපකාර අයදින්න.

## අද දින බයිබල් කියවීම - ක්‍රියා 9 පරිච්ඡේදය

# දෙවන සතිය

මෙම සතිය තුළ අප අවධානය යොමු කරන්නේ **ශුද්ධාත්මයාණන් වහන්සේගේ මගපෙන්වීම පිළිබඳවය.** ශුද්ධාත්මයාණන් වහන්සේ උපකාරකරන්නෙක්, සැලසුම් කරුවෙක් සහ මග පෙන්වන්නෙකු ලෙස අපි ජීවිතය තුළට එන බවට යේසුස් වහන්සේ පොරොන්දු විය. පෙන්තකොස්ත දවසේ දී මුල්ම සභාවේ ඇදහිලි වන්තයන්ට ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණි කළ ඔවුන් කොතැනට ගියද, සුභාරංචිය ප්‍රකාශ කිරීමට ,සුවවීමේ හාස්කම් කිරීමට සහ බලාපොරොත්තුව සහ නිදහස ගෙන ඒමට හැකි විය. මුල් ඇදහිලිවන්තයන් කෙරෙහි පැමිණි එම ශුද්ධාත්මයාණන් වහන්සේ ම අද දින අප තුළ ජීවමානව සිටිති.

දෙවියන් වහන්සේගේ සැලැස්ම සහ අරමුණ තුළ ඉදිරි පියවරක් තැබීමට නම් අප ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ වර්ධනය වන්නාවූ ඇදහිල්ලක් ගොඩනගා ගත යුතුය. මෙය සෙනඟගේ ජීවිත තුළ සිදු වේද ? අප මෙලෙස වර්ධනය වන්නාවූ ඇදහිල්ලක් ගොඩනගා ගන්න නම් ප්‍රථමව අපි ශුද්ධාත්මයාණන් වහන්සේව දැනගැනීමත්, උන් වහන්සේගේ හඬ පැහැදිලිව අවබෝධ කර ගැනීමෙන් සහ අපේ ජීවිතවල මගපෙන්වීම උන්වහන්සේට භාරදෙමින් සහ උන්වහන්සේට අවනත වීමෙන්ය. අප ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙහි මෙලෙස විශ්වාසයක් ඇදහිල්ලක් වර්ධනය වීමට පටන් ගත් කල දෙවියන් වහන්සේ අප ජීවිතවලට තබා ඇති අරමුණ ඉෂ්ට කර ගැනීමට බලය අපට ලැබෙයි.

# ශුද්ධාත්මයෙන් පූර්ණ වීම

මුද්‍රික පානයෙන් මත් නොවන්න. එයින් අනාචාරකම් හටගන්නේ ය. ඒ වෙනුවට ආත්මයාණන්ගෙන් පූර්ණ වන්න.

**එපීස 5:18**

## සිතුවිල්ල

අප තුළට අවශෝෂණය කර ගන්නා වූ සෑම දෙයක්ම අපට යහපත් හෝ ප්‍රයෝජනවත් නොවේ. අප පිරෙන්නේ මොනවයින්ද ඒකෙන් අපව වෙනස් කරනවා.අපි ශුද්ධාත්මයෙන් පූර්ණ වූ විට උන්වහන්සේ අප වෙනස් කරනවා. ක්‍රිස්තුස්වහන්සේ මෙන් වීමට ශුද්ධාත්මයාණන් වහන්සේ ගෙන් පූර්ණව සිටීමට සූදානම් වන්න. ශුද්ධාත්මයන් වහන්සේට යටත්ව ජීවත් වීමේ ඉරියව්ව තුළින් දවස ආරම්භ කරන්න.

## යාච්ඤාව

- අප ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ කරන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්න.
- ශුද්ධාත්මයාණන් වහන්සේගේ මගපෙන්වීමට ජීවිතයේ සෑම අංශයක්ම යටත් කරන්න.
- ඔබට කතා කිරීමද ශුද්ධාත්මයන් වහන්සේට ඉඩ දෙන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 10 පරිච්ඡේදය**

# ආත්මයාණන් වහන්සේට අනුව ජීවත්වීම

'මාංසික ලෙස ජීවත් වන්නෝ මාංසික දේවලට ද ආත්මයාණන් අනුව ජීවත් වන්නෝ ආධ්‍යාත්මික දේවලට ද මුළු සිතින් ප්‍රිය කරති. මාංසික චේතනාවේ විපාකය මරණය වේ; ආධ්‍යාත්මික චේතනාවේ විපාකය ජීවනය හා ශාන්තිය වේ. '

**රෝම 8:5-6**

## සිතුවිල්ල

ශුද්ධාතමයාණන් වහන්සේ අපට හරි දැක්මක් දෙනවා. නමුත් අපගේ ඉලක්කය අප අවධානය බොහොම පහසුවෙන් මෙම ලෝකයේ තාවකාලික මෙන්ම ඉක්මනින් ම නැති වී යන දේ කෙරෙහි යොමු විය හැක. ශුද්ධාත්මයාණන් වහන්සේට බාර වීම සහ යටත් වීම තුළින් අපගේ අවධානය දෙවියන් වහන්සේ ප්‍රසන්න කරන සහ සදාකාලික වටිනාකමක් ඇති දේ කෙරෙහි නැවත යොමු කරගත හැකිය.
ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩදෙන්න ඔබගේ සිතුවිලි පාලනය කරන්න. එමෙන්ම ඔබගේ එල්ලයන් තුල අධිෂ්ඨානයෙන් සිටීමට තීරණයක් ගන්න.

## යාච්ඤාව

- ලෝකයේ තාවකාලික දේ වලින් ඉවත්වෙන්න.
- සදාකාලික දේ කෙරෙහි දැඩි යොමුවක් තබා ගන්න.
- සෑම සිතිවිල්ලක්ම ක්‍රිස්තුස් වහන්සේට සිරකොට අවනත කරන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 11 සහ 12 පරිච්ඡේදය**

# ශුද්ධාත්මයාණන් වහන්සේගේ හඬ ඇසීම

‘එසේ වී නමුත්, ඒ තැනැන් වහන්සේ, එනම්, සත්‍යතාවේ ආත්මයාණන් වහන්සේ පැමිණි කල, උන් වහන්සේ සම්පූර්ණ සත්‍යය කරා යැමට ඔබට මඟපෙන්වන සේක. මන්ද, උන් වහන්සේ සිය කැමැත්තෙන් ම කතා නොකොට, උන් වහන්සේ අසන දේ ම පවසා, මතු සිදුවන දේ ඔබට ප්‍රකාශ කරනු ඇත. ‘

**යොහාන් 16:13**

## සිතුවිල්ල

සිතිවිල්ල - අපගේ එදිනෙදා ජීවිතය තුළ අප දෙවියන් වහන්සේගේ හඬ හඳුනා ගත යුතුය. මන්ද අප අවට ඇති විවිධ හඬවල් තුළින් අප විඩාවට පත් වී ඇත. අප ප්‍රවේශම් නොවුණහොත් මෙම හඬවල් අපිව ශුද්ධාත්මයාණන් වහන්සේ ගේ හඬින් ඈත් කිරීමට ද හැකියාව ඇත. අපි ශුද්ධාත්මයාණන් වහන්සේගේ හඬ හඳුනාගන්ට අවශ්‍යයි සහ උන් වහන්සේගේ හඬ ඇසීමට අප යම් ආකාරයකට ක්‍රියා කළ යුතුය. ඔබ තෝරාගන්න ඔබ අසන දේ.මන්ද ඔබ අසන දේ තුළ ආරක්ෂාකාරී වන්න. එමෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේගේ හඬ හඳුනාගැනීමට ඉගෙන ගන්න.

## යාච්ඤාව

- ශුද්ධාත්මයාණන් වහන්සේගේ හඬෙන් අපිව ඉවත් කරන්නා වූ හඬ වලට ඇහුම්කන් නොදීමට තීරණය ගන්න.
- ශුද්ධාතමයාණන් වහන්සේ අප වෙත එවීම කෙරෙහි දෙවියන් වහන්සේට ස්තුතිවන්ත වන්න.
- ශුද්ධාත්මයාණන් වහන්සේගේ හඬ හඳුනා ගැනීමට දෙවියන් වහන්සේගෙන් උපකාර ඉල්ලන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 13 පරිච්ඡේදය**

# ආත්මයනෝ යුක්තව යාච්ඤා කිරිම

'එලසෙ ම ශුද්ධාත්මයාණන් වහන්සේත් අපගේ දුර්වලකමේදී අපට ආධාර දනෙ සේක. නිසි ලසෙ යාච්ඤා කළ යුත්තේ කසෙේ දැ යි අපි නාොදනිමු. එහතේ ශුද්ධාත්මයාණන් වහන්සේ ම වචනවලින් කිය නාොහැකි සුසුම්ලෑම්වලින් දවේියන් වහන්සේ වතෙ අප වනෙුවනෝ අයැදින සේක. '

**රෝම 8:26**

## සිතුවිල්ල

සිතිවිල්ල - අප මුහුණ දනේනා වූ තත්ත්වයන් හෝ සිදුවීම් නිසා අප විඩාවට පත්ව අප යාච්ඤා කළ යුත්තේ කුමක් උදසො ද යන වග අප නාොදන්නා විය හැක. සමහරවිට අප වැරදි දේ උදසොද යාච්ඤා කරයි. අප යාච්ඤා කරන්න නාොදන්නා විට ශුද්ධාත්මයාණන් වහන්සේ අපිටඋදව් කරනවා දවේියන් වහන්සේගේ කැමැත්ත අනුව යාච්ඤා කරන්න.

## යාච්ඤාව

- ශුද්ධාත්මයාණන් වහන්සේ කරෙහෙි යැපීමට හැකි වනෙ පිරිස යාච්ඤා කරන්න.
- යාච්ඤාව තුළ ශුද්ධාත්මයන් වහන්සේට මගපනේවීම පිළිබඳ විශ්වාස කරන්න.
- ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟ පනේවීමට යටත් වන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 14 සහ 15 පරිච්ඡේද**

# නැවුම් එළිදරව්වක් ලබාගැනීම

ජෝෂුවා ජෙරිකෝ නුවර ළඟ සිටිය දී, තම හිස ඔසවා බැලූ විට, තමා ඉදිරිපිට කොපුවෙන් ඇදගත් කඩුවක් ඇති මිනිසෙකු සිටිනු දුටුවේ ය. ජෝෂුවා ඔහු සමීපයට ගොස්, "ඔබ අපේ පැත්තට ද නැතහොත් අපේ විරුද්ධ කාරයන්ගේ පැත්තට දැ"යි විචාළේ ය. ඔහු පිළිතුරු දෙමින්, 'එසේ නොවේ; සමිඳාණන් වහන්සේගේ සේනාවේ අධිපතියා ව මම දැන් ආවෙමි"යි කීවේ ය. එවිට ජෝෂුවා මුණින්තළා වී ඔහුට නමස්කාර කරමින්, "ස්වාමීන් වහන්ස ඔබේ මෙහෙකරුවාට කුමක් වදාරන සේක් දැ"යි ඇසී ය. සමිඳාණන් වහන්සේගේ සේනාවේ අධිපතියා ජෝෂුවාට කතා කොට, "නුඹ සිටින තැන ශුද්ධ භූමියක් නිසා නුඹේ පාවහන් ගලවන්නැ"යි කීවේ ය. ජෝෂුවා ද එසේ කළේ ය.

**යෝෂුවා 5:13-15**

## සිතුවිල්ල

සිතුවිල්ල - මහත්වූ ආත්මික ඉදිරි පියවරක් ලැබෙනුයේ දෙවියන් වහන්සේ කවුද යන්න පිළිබඳ වූ නැවුම් එළිදරව් කිරීමකිනි. දෙවියන් වහන්සේ කවුද කියා අපට එළිදරව්වක් ලැබෙන විට අපට සහතිකයක් ලැබෙනවා උන්වහන්සේ අප යන සෑම දෙයක් උන්වහන්සේ දන්නා බවටත් අපව උන් වහන්සේට තෝරනවා කියලා. දෙවියන් වහන්සේ සොයන්න එපා උන් වහන්සේව ඔබට අවශ්‍ය වන වෙලාවට පමණක්. ඔබ කරන සියල්ලේ දී දෙවියන් වහන්සේ කවුද කියන දෙයට ඔබ ශුද්ධාත්මයාණන් වහන්සේගේ නැවුම් එළිදරව්වක් ඉල්ලගන්න.

## යාච්ඤාව

- දුෂ්කර තත්වයන් හෝ කාරණා පිළිබඳව අවධානය යොමු කිරීමෙන් ඈත් වන්න.
- අපගේ ජීවිත තුළ දෙවියන් වහන්සේ පිළිබඳව නැවුම් එළිදරව්වක් වෙනුවෙන් අයදින්න.
- දෙවියන් වහන්සේගේ එළිදරව් ජයග්‍රහණය ගෙන එන බව විශ්වාස කරන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 16 පරිච්ඡේදය**

# අරමුණක් උදෙසා ආලේපය

මහෝත්තම දෙවි සමිඳුන්ගේ ආත්මානුභාවය මා කෙරෙහි පිහිටා ඇත. දිළිඳුන්ට සුබ අස්න දෙසීමට ද බිඳුණු සිත් ඇත්තන්ට සුව සෙත දීමට ද වහලුන්ට මිදීම දානය කරන්න ද සිරකරුවන්ට නිදහස දන්වන්න ද එතුමාණෝ මා ආලේප කළ සේක.

**යෙසායා 61:1**

## සිතුවිල්ල

අප අවට ඉන්න අයට ලංවීමට දෙවියන් වහන්සේ අපව ආලේප කර තිබෙනවා. ශුද්ධාත්මයාණන් වහන්සේ අප කෙරෙහි පැමිණ කල ගැලවීමේ සහ බලාපොරොත්තුවේ පණිවිඩය ප්‍රකාශ කිරීමට ආලේපයක් ලබයි. ශුද්ධාත්මයාණන් වහන්සේ තමයි අපව යවලා අපව බලවත් කරන්නේ. ඔබ දන්නා වූ යම් අවශ්‍යතාවක් ඇති කෙනෙකු හඳුනා ගන්න. සහ එම අවශ්‍යතාවය ඉටු කළ හැක්කේ කෙසේදැයි ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් විමසන්න.

## යාච්ඤාව

- නැති වූ අතරමං වූ අය වෙනුවෙන් අලුත් හදවතක් වෙනුවෙන් අයදින්න.
- අප අවට සිටින අයගේ අවශ්‍යතා උදෙසා අපගේ දෑස් විවර කරන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්න.
- නැති වූ අය උදෙසා සුභාරංචිය ප්‍රකාශ කිරීමට නැවුම් ආලේපයක් සහ නිර්භීතකමක් දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 17 සහ 18 පරිච්ඡේදය**

# ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම

එකල දේව දූතයා මට කතා කරමින්, “සෙරුබ්බාබෙල්ට සමිඳාණන් වහන්සේගේ මේ පණිවුඩය දෙන්නැ”යි කී ය. එය මෙසේ ය: “නුඹට ජය අත් වන්නේ සේනා බලයෙන් වත්, සිය ශක්තියෙන් වත් නොව, මාගේ ආත්මානුභාවයෙන් ය.

**සකෙරියා 4:6**

## සිතුවිල්ල

අපගේ ශක්තියෙන් පළපුරුද්ද හා ප්‍රඥාව මත විශ්වාසය තැබීමෙන් අපව අනාගතයට රැගෙන යා නොහැක. අප සම්පූර්ණයෙන්ම ශුද්ධාත්ම මඟපෙන්වීම කෙරෙහි විශ්වාසය තැබිය යුතුය. අපට අවශ්‍ය වූ විට ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැටහීම ලබා දෙනු ලබයි. ශුද්ධාත්මයාණන් වහන්සේ අපිට  බලය දෙනවා අමාරු අවස්ථා තුළින් ජයගන්න. ඔබ මොන දේ උත්සහ කළ ද කිසිදු හෝ ආත්මික ඉදිරි මඟ පෙන්වීමක් නොපෙන්වන ජීවිතයේ යම් හෝ පැතිකඩක් හෝ අංශය හෝ තිබේද? ඔබගේ ශක්තියෙන් යම් දෙයක් කිරීමට උත්සාහ දරන වඩා ඔබට යම් දෙයක් කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේට මඟ පෙන්වන ලෙස ඉල්ලීම් කරන්න.

## යාච්ඤාව

- ඔබගේ ශක්තිය පළපුරුද්ද හෝ ප්‍රඥාව කෙරෙහි විශ්වාසයෙන් ඉවත්වෙන්න.
- සම්පූර්ණයෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමට තීරණයක් ගන්න.
- දෙවියන් වහන්සේ මඟපෙන්වන සියලු දෙයට පියවර තැබීමට උන්වහන්සේගෙන් ධෛර්යය සහ නිර්භීතකම එල්ලා යාච්ඤා  කරන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 19 පරිච්ඡේදය**

# තුන්වන සතිය

මෙම දවස් විසි එකෙහි (21) ගමන තුළ අවසාන සතිය තුළ අපි "අත්පත් කර ගැනීම" කෙරෙහි අවධානය යොමු කරමු. මේ තුළ අපි අපගේ ජීවිතයේ විවිධ අංශ විවිධ පැතිකඩ තුළ ජයග්‍රහණය අත් දැකීම පිණිස නිර්භීත පියවර කීපයක් ගනිමු.අප අවට ඇති හැමදේම තුල සිර වී ඉදිරියට යාමක් නොපෙනෙන විට, අප මලානිකව අක්‍රියව සිටීම දෙවියන් වහන්සේගේ කැමැත්ත නොවේ. උන්වහන්සේ මෙම කාලය තුළ අප හට ලබාදී ඇති සැලසුම් සහ අරමුණු මෙන්ම නව ආත්මික තලයක් අත්පත් කරගනිමින් ඉදිරියට යෑම උන්වහන්සේ ගේ ආශාවයි. දෙවියන් වහන්සේ නිරන්තරයෙන් අප ජීවිතය තුල අලුත් දෙයක් සිදු කරයි. නමුත් අප එය හඳුනාගන මුලු හදවතම වහන්සේගේ මඟ පෙන්වීමට යටහත් විය යුතුය. මේ සතිය තුළ ඔබගේ ඉදිරි ගමන උදෙසා ඔබගේ දර්ශනය සහ තත්වයන් වෙනස් කිරීමට දෙවියන් වහන්සේට ඉඩදෙන්න.

# අපගේ දර්ශනය (සිතිවිලි රටාව) වෙනස් කර ගැනීම

සමිඳාණන් වහන්සේ ද ඔහු පිටතට රැගෙන ගොස්, "අහස දෙස බලා, හැකි නම්, ඔය තාරකා ගණන් කරන්න; නුඹේ දරු පරපුර එසේ ම වන්නේ ය"යි වදාළ සේක. ආබ්‍රම් ද සමිඳාණන් වහන්සේ අදහා ගත්තේ ය. ඒ ඇදහිල්ල ඔහුගේ ධර්මිෂ්ඨකම වශයෙන් උන් වහන්සේ පිළිගත් සේක.

**උත්පත්ති 15:5-6**

## සිතිවිල්ල

ආබ්‍රහම්ගේ භෞතික කාරනා දෙවියන් වහන්සේගේ පොරොන්දුව සම්පූර්ණ වීම සීමා සහිත කරවන බවක් පෙනෙන්නට තිබුණා. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ පොරොන්දුව ඉෂ්ට කරයි ද යන්න පිළිබඳ සැකයක් තිබුණා. ඔබ සිතුවිලි රටාවන්ට දෙවියන් වහන්සේගේ පොරොන්දු බාල කර සැක කිරීමට ඉඩ තබන්න එපා.
දෙවියන් වහන්සේට පුළුවන් ඔබට අලුත් දැක්මක් දෙන්න. අපි ඒ නව දැක්ම ලබා ගත් විට අපට අලුත් ඇදහිල්ලක් ලැබෙන දෙවියන් වහන්සේ පොරොන්දු අනිවාර්යයෙන්ම ඉෂ්ට කරනවා කියලා. උන්වහන්සේ එය උන්වහන්සේගේ වචනයෙන්, නායකයන් තුළින්, නොමැති නම් අපගේ සහෝදර ඇදහිලිවන්තයන් තුළින් එළිදරව් කිරීමට හැකියාව තිබෙනවා.

## යාච්ඤාව

- දෙවියන් වහන්සේට ඔබේ ජීවිතයේ තිබෙන පැතිකඩයන් පෙන්වන ලෙස හා රැකියාවේ, සම්බන්ධකම් හෝ සේවය තුළ ඔබට අලුත් දැක්මක් අවශ්‍ය තැන් දැකීමට පෙන්වන ලෙස ඉල්ලන්න.
- දෙවියන් වහන්සේට සහ උන්වහන්සේ අපට දී ඇති පොරොන්දු කෙරෙහි හැරෙන්න.
- නව සිතුවිලි දැක්මක් දෙවියන් වහන්සේගේ ඉල්ලන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 20 පරිච්ඡේදය**

# ඔබගේ ධාරිතාව වර්ධනය කරගැනීම

'දාවිත් පිළිතුරු දෙමින් සාවුල්ට මෙසේ කී ය: "ඔබේ මෙහෙකරුවා වන මා, මාගේ පියාගේ බැටළුවන් බලාගෙන සිටිය දී සිංහයෙකු හෝ වලසෙකු හෝ අවුත් රැළෙන් බැටළුවෙකු ගත්තොත්, මම ඌ පස්සේ ගොස්, ඌට පහර දී ඌගේ කටින් බැටළුවා ගළවාගන්නෙමි. ඌ මට කඩාපැන්න විට මම ඌ බෙල්ලෙන් අල්ලා ඌට පහර දී මරන්නෙමි. ඔබේ මෙහෙකරුවා වන මම සිංහයන් ද වලසුන් ද මරා ඇත්තෙමි. ජීවමාන දෙවියන් වහන්සේගේ සේනාවලට නින්දා කළ මේ අචර්මඡේදිත පිලිස්තියයාටත් එසේ කරමි, '

**1 සාමුවෙලේ 17:34-36**

### සිතිවිල්ල

අභියෝගාත්මක තත්වයන් හා කරුණු අපගේ ධාරිතාව වර්ධනය කර ගැනීමට තිබෙන අවස්ථාවන් වේ. දාවිත් සටන් බිමේදී ගොලියත්ව පරාජය කිරීමට ප්රථමව තමාට වඩා විශාල සතුරෙකුට මුහුණ දීම කුමන ආකාරයටද යන්න හොඳින් දැන සිටියා. මේ තුළින් දාවිත්ගේ ධාරිතාව බලය වැඩි වී ගොලියත්ට විරුද්ධව සිට ගෙන ඔහුව පරාජය කිරීමට හැකියාව ලැබුණා. එය ආරම්භ වන්නේ විශ්වාසවන්තභාවය තුළිනි.  දෙවියන් වහන්සේට පුලුවන් අපිව පාවිච්චි කරන්න උන් වහන්සේගේ සැලසුම් සහ පරමාර්ථයක් උදෙසා. නමුත් දෙවියන් වහන්සේ අපට පවරා ඇති සියල්ල තුළ අපි විශ්වාසවන්තව සිටින්නට අවශ්යයි. මෙම කාලය තුළ දෙවියන් වහන්සේ ඔබට කැඳවා ඇති දෙයට විශ්වාසවන්තව සිටීමට තීරණයක් ගන්න.

### යාච්ඤාව

- ඔබගේ ජීවිතයේ ධාරිතාව වර්ධනය කළ යුතු අංශ දෙවියන්වහන්සේට එළිදරව් කරන ලෙස ඉල්ලන්න.
- මුළු හදවතින් දෙවියන් වහන්සේ අනුව යාමට කැපවීමක් ගන්න.
- දෙවියන් වහන්සේ ඔබ කැඳවූ දෙයට ඔබට විශ්වාසවන්ත වීම සඳහා  ශක්තිය සහ වැටහීම උන් වහන්සේගෙන් ඉල්ලන්න.

**අද දින බයිබල් කියවීම - ක්රියා 21 සහ 22 පරිච්ඡේද**

# බයිබල් කොටස

ජාබෙශ් තමාගේ සහෝදරයන්ට වඩා ගෞරව ලැබුවේ ය. ඔහුගේ මව, "මම වේදනාවෙන් ඔහු ලැබුවෙමි"යි කියා ඔහුට ජාබෙශ් යන නම තැබුවා ය. ජාබෙශ් ඉශ්‍රායලේවරුන්ගේ දෙවියන් වහන්සේට යාච්ඤා කොට, "අහෝ, ඔබ මට ආශීර්වාද කර, මාගේ සීමාව විශාල කර, ඔබේ අතින් මට පිහිට වී, මට දුක් නූපදින ලෙස විපතෙන් මා ආරක්ෂා කළ මැනව"යි කීවේ ය. දෙවියන් වහන්සේ ද ඔහුගේ ඉල්ලීම ඉෂ්ට කළ සේක.

**1 වංශාවලියේ 4:9-10**

## සිතිවිල්ල

යාබේෂ් ඔහුගේ උපතේදී ලබන ලද අනන්‍යතාවය (වේදනාවෙන් උපත ලද යන්න) ඔවුන් තුළ දෙවියන් වහන්සේගෙන් ඔහුට ආශිර්වාද කරන ලෙස නිර්භීතව ඉල්ලීමට කිසිදු බාධාවක් නොවීය. ඔහු ප්‍රකාශ කළ දේ තුළ තිබූ ඇදහිල්ල නිසා දෙවියන් වහන්සේ යාබේෂ් ගේ ඉල්ලීම ඉෂ්ට කරන ලදී. අපට අවශ්‍යයි දැනගන්න දෙවියන් වහන්සේ අපට දී තිබෙන අනන්‍යතාවය. දෙවියන් වහන්සේ කියනවා අපි ආශිර්වාද ලද්දන් බව. එලෙසම උන් වහන්සේ අපට ප්‍රේම කර තිබෙනවා හා අප කෙරෙහි උන්වහන්සේ ප්‍රසන්නව සිටින බව. තෝරා ගන්න සතුරාගේ බොරු ප්‍රතික්ෂේප කරන්න. මන්ද අප සතුරන්ගේ දේ ඇසූ විට දෙවියන් වහන්සේ ඉදිරියේ අපි කවුද කියන එක විකෘති වෙනවා. දෙවියන් වහන්සේ ඉදිරියේ ඔබ කවුද කියන්න ප්‍රකාශ කරන්න ආරම්භ කරන්න.

## යාච්ඤාව

- දෙවියන් වහන්සේට අප කෙරෙහි වූ සිතිවිල්ල යහපත් බැවින් උන් වහන්සේට ස්තුති කරන්න.
- දෙවියන් වහන්සේ ඔබට දී ඇති අන්‍යතාවය අල්ලාගන්න.
- දෙවියන්වහන්සේ තුල අපට ප්‍රේම කරන බවත් ආශිර්වාද කරන බවත් අධික අනුග්‍රහය ඇති බවත් ප්‍රකාශ කරන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 23 සහ 24 පරිච්ඡේද**

# එකිනෙකා ශක්තිමත් කරගැනීම

ඔහු ට කතා කොට, "සිරියන්වරුන් මට වඩා බලවන්ත වුවොත් ඔබ මට උපකාර කරන්න; අම්මොන්වරුන් ඔබට වඩා බලවන්ත වුවොත් මම අවුත් ඔබට උපකාර කරන්නෙමි. අපේ සෙනඟ උදෙසාත්, අපේ දෙවියන් වහන්සේගේ නගර උදෙසාත් ධෛර්යවත් වී සිටින්න; ස්ථිර ව සිටින්න; සමිඳාණන් වහන්සේගේ කැමැත්ත ඉෂ්ට වේවා"යි කී ය.

**2 සාමුවෙල් 10:11-12**

## සිතිවිල්ල

අප කැඳවා තිබෙන්නේ එකිනෙකා සමඟ සිට ගන්නටය. මෙම ජීවන ගමන අපි තනිව ගමන් කළ යුත්තක් නොවෙයි. දෙවියන් වහන්සේ අපි එකිනෙකාට උපකාර කිරීමට මෙන්ම ධෛර්යමත් කිරීමට කැඳවා ඇත. එකිනෙකා සමග සිට ගැනීමට තෝරාගැනීම පූජා වීමකි. අපි පූජා කිරීමට කැමැත්තක් තිබෙන්න අවශ්‍යයි. ඒ සඳහා දෙවියන් වහන්සේ අපට අවශ්‍ය සියලු දේ සපයයි කියලා විශ්වාස කරන්න අවශ්‍යයි. එසේ කිරීමෙන් දෙවියන් වහන්සේගේ අරමුණු අප තුළ සහ අපි තුළින් අප සැවොම අපගේ ජීවිතවල ජයග්‍රහණය අත්විඳීමට හැකිවනු ඇත.

## යාච්ඤාව

- දුෂ්කර තත්ත්වයන් තුළින් යන්නා වූ අය උදෙසා දයාවේ හදවතක් ඉල්ලන්න.
- අපට ගෝලත්වයට ගෙන යා හැකි සහ උපදේශනය ලබා දිය හැකි අය පෙන්වන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්න.
- සභාවේ එකමුතුකම උදෙසා යාච්ඤා කරන්න.

## අද දින බයිබල් කියවීම - ක්‍රියා 25 පරිච්ඡේදය

# සිදු වන්නාවූ මහත්වූ ආත්මික ඉදිරි පියවර හඳුනාගැනීම

'එහෙත්, සමිඳාණෝ මෙසේ වදාරන සේක: "පසුගිය දේ සිහි නොකරන්න; පෙර වූ දේ ගැන කල්පනා නොකරන්න. බලන්න, මම අලුත් දෙයක් කරන්නෙමි. එය දැනුදු ඉටු වේ; නුඹලාට එය නොපෙනේ ද? මම කාන්තාරයෙහි පවා මාර්ගයක් සාදා, එහි ජලධාරා ඇති වන්න සලස්වන්නෙමි. '

යෙසායා 43:18-19

## සිතිවිල්ල

දෙවියන් වහන්සේ නිරන්තර ඔබගේ ජීවිතය තුළ ක්‍රියා කරනවා. උන්වහන්සේගේ සිතුවිලි හා මාර්ග අපගේ සිතුවිලි සහ මාර්ග වලට වඩා උසස්ය. ඉතා දුෂ්කර සහ අභියෝගීතාවයන් වලට පවා ක්ෂණිකයෙන් උන්වහන්සේට වෙනස් කළ හැක. දෙවියන් වහන්සේට කරන්න පුළුවන් දේට සීමාවක් දාන්න එපා. අප දෙවියන් වහන්සේ ආරම්භ කළ දේ පිළිබඳව විශ්වාසයක් මෙන්ම ඉදිරියේ සිදු වන්නාවූ මහත්වූ ආත්මික ඉදිරි පියවර හෝ විවෘත වන්නාවූ ඉදිරි ගමන පිළිබඳව විශ්වාසයක් තැබිය යුතුය. ඉදිරියේ ඇති වන්නාවූ මහත්වූ ආත්මික පියවර යෙහි සලකුණු වශයෙන් ඇති සෑම කුඩා ජයග්‍රහණයකට ප්‍රසිද්ධියේ උන්වහන්සේට ස්තුති දෙන්න.

## යාච්ඤාව

- අපට නොපෙනුනද දෙවියන් වහන්සේ අපගේ ජීවිතය තුළ ක්‍රියා කරන නිසා ස්තුති කරන්න.
- ඉදිරියේ වූ දේ ආත්මික ඉදිරි පියවර විවෘත වන්නාවූ ආත්මික මගේ සලකුණු හඳුනා ගැනීමට උපකාර වෙන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්න.
- උන්වහන්සේ එම මහත් වූ ආත්මික ඉදිරි පියවර අපට නිසැකවම දෙනු ඇතැයි විශ්වාස කරන්න.

## අද දින බයිබල් කියවීම - ක්‍රියා 26 පරිච්ඡේදය

# ඉදිරියට ගමන් කිරීම

'සහෝදරයෙනි, මම තවමත් ඒ දේ අත්කරගෙන ඇතැ යි නොසිතමි. එක දෙයක් මට වැදගත් ය: පසුගිය දේ අමතක කරදමා, ඉදිරියෙහි තිබෙන දේ දෙස ම නෙත් යොමා, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ මඟින් දෙවියන් වහන්සේ දෙන්නට අදහස් කරන ස්වර්ගීය ත්‍යාගය ලබන පිණිස දිනුම් කණුව කරා මම දුව යමි. '

**පිලිප්පි 3:13-14**

### සිතිවිල්ල

දෙවියන් වහන්සේ අපගේ ජීවිතය තබා ඇති සැලැස්මට සහ අරමුණට පා තැබීමට අපගේ අතීතයේ වැරදි, අසාර්ථක කම් හා අපගේ දෝෂයන්හි බාධාවක් විය හැකිය. අපේ ඉදිරියෙන් ඇති දේ පිළිබඳව අවධානය යොමුකළ යුතු අතර අතීතය අමතක කොට යටපත් කර දැමිය යුතුය. තමාගේ අතීතයේ වැරදි අසාර්ථක කම් හෝ දෝෂයන් කෙරෙහි අවධානය යොමු කිරීම වෙනුවට දෙවියන් වහන්සේ තවත් මා තුළ යම් දෙයක් කරන බව හඳුනාගන්න. තෝරාගන්න ඔබගේ දැක්ම පවත්වාගෙන යන්න සහ ඉදිරිය දෙස බලන්න. ඔබගේ දිවීමේ තරගයේ අන්තිමයට ලැබෙන සදාකාලික විපාකය ගැන බලා සිටින්න.

### යාච්ඤාව

- අතීතයේ වැරදි ,අසාර්ථක කම් හා දෝෂ ඉවත දමන්න.
- දෙවියන් වහන්සේ අපට මඟ පෙන්වන සැලසුම් සහ අරමුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
- අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කරගෙන යෑමට දෙවියන් වහන්සේගේ ශක්තිය ඉල්ලන්න.

### අද දින බයිබල් කියවීම - ක්‍රියා 27 පරිච්ඡේද

# ජයග්‍රහණය අත්පත් කරගන්න

'සමිඳාණන් වහන්සේ අමෝරිවරුන් ඉශ්‍රායලේ සෙනඟට පාවා දුන් ඒ දවසේ දී ජෝෂුවා සමිඳාණන් වහන්සේට කතා කොට, මුළු ඉශ්‍රායලේවරුන්ගේ ඇස් හමුයෙහි මෙසේ කීවේ ය: "එම්බා සූර්යය! ගිබියොන්ට ඉහළින් නොසෙලී වී සිටින්න; එම්බා චන්ද්‍රය! අයාලෝන් මිටියාවත ඉහළින් එසේ ම සිටින්න." එවිට සෙනඟ තමන්ගේ සතුරන්ගෙන් පළිගන්න තුරු සූර්යයා නැවතී සිටියේ ය; චන්ද්‍රයා ද නැවතුණේ ය. මෙපෙවත් ජාෂාර්ගේ පොතේ ලියා තිබෙනු නොවේ ද? සූර්යයා සම්පූර්ණ දවසක් පමණ බැස යාමට ඉක්මන් නොවී අහස මැද සිටියේ ය. '

**ජෝෂු 10:12-13**

## සිතිවිල්ල

අප ජයග්‍රහණය ලැබීමට නම්, අප ලුහු බැඳිය යුතුය. ජයග්‍රහණය සඳහා ලුහුබැඳීම ආරම්භ වන්නේ අපේ හදවතේ ඒත්තු ගැනීම තුළිනි.
යොෂුවා ඉශ්‍රායලේ සෙනඟට විරුද්ධ ව එන සතුරන්ගෙන් ජයග්‍රහණය ලබන බවට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව තදින් අල්ලාගෙන සිටියේය. සම්පූර්ණ ජයග්‍රහණය ලැබෙන තෙක් ඔහු තෘප්තිමත් නොවීය. අපේ හදවත තුළ තිබෙන ඒත්තුගැනීම තීරණය කරනවා අපේ ප්‍රතිචාරය. යෝෂුවා විය නොහැකි දයෙක් වේ යැයි තදින් විශ්වාස කළා. ඔහු සටන දිනන් තෙක් ඉරට නැවතී සිටින ලෙස අණ කළේය. එම අයුරින් අප දෙවියන් වහන්සේගේ පොරොන්දුව සම්පූර්ණ ලෙස ඉෂ්ට වන තෙක් ඒවා තදින් අල්ලාගෙන සිටිය යුතුය. මෙම වසරේ ඔබ දෙවියන් වහන්සේ විශ්වාස කරන්නේ කුමක් කිරීමට ද ? දෙවියන් වහන්සේගෙන් පොරොන්දුවක් ඉල්ලන්න. එය ගැන තව කෙනෙකුට පවසන්න. කාටද පුළුවන් යාච්ඤා කරන්න සහ විශ්වාස කරන්න ඔබව.

## යාච්ඤාව

- විය නොහැකි දේ වේ යැයි විශ්වාස කිරීමට දෙවියන් වහන්සේගෙන් ඇදහිල්ල ඉල්ලන්න.
- උන්වහන්සේගේ පුරුදු අල්ලාගෙන සිටීමට ශක්තිය ඉල්ලන්න.
- දුෂ්කර වුවද අධිෂ්ඨානයෙන් කටයුතු කරන්න.

**අද දින බයිබල් කියවීම - ක්‍රියා 28 පරිච්ඡේදය**

**Victory Family Centre Singapore**
© December 2020
www.vfc.org